FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහස: නිරීක්ෂණ වාර්තාව
# ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
# Media Freedom Rights Monitoring Report

MFRMD

## 2022 ඔක්තෝබර්

2 වන වෙළුම - කලාප අංක 10


හෂාන් ජීවන්තට දින 50කට පසු නිදහස


"රැඳවුම් නියෝග දීර්ඝ නොකරන්න" මානව හිමිකම් කොමිසම කියයි


නිමලරාජන් ඝාතනයට වසර 22යි!

**මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය උපයෝගී කර ගන්නා විෂය පථයට/ සංරචකයන්ට අදාළ සිදුවීම් 15ක් 2022 ඔක්තෝබර් මාසයේදී නිරීක්ෂණය විය. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතබවට අදාළ සිදුවීම් 02ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 11ක් සහ ව්‍යුහාත්මක කොන්දේසි යන සංරචකයට අදාළ සිදුවීම් 02ක් ඒ අතර වෙයි.**

## නිරීක්ෂණය වූ සිදුවීම්

1. කොළඹ නගරයේ ප්‍රදේශ කිහිපයක් අධි ආරක්ෂිත කලාප ලෙස නම් කරමින් රජය නිකුත් කර තිබූ ගැසට් නිවේදනය අවලංගු කිරීම.
2. කැලණිය සහ රජරට විශ්වවිද්‍යාලවල සිසුන් පිරිසක් ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාසයට කැඳවීම.
3. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තබාගෙන සිටි ශිෂ්‍ය ක්‍රියාකාරික හෂාන් ජීවන්ත අධිකරණයෙන් නිදහස් කිරීම.
4. අරගලයේ ක්‍රියාකාරිකයකු වූ ෆයිසාන් අහමඩ් අත්අඩංගුවට ගෙන මුදා හැරීම.
5. ගෝල්ෆේස්හි පැවති 'අරගලයේ විරු සමරුව' වැඩසටහනට පොලිසිය බාධා කිරීම හා සහභාගී වූවන් 6 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.
6. නීතිඥවරුන් සහ වෘත්තිකයින් විසින් පැවැත්වීමට නියමිත උද්ඝෝෂණයක් වළක්වන ලෙස පොලිසිය කළ ඉල්ලීමක් අධිකරණය ප්‍රතික්ෂේප කිරීම.
7. ඔක්තෝබර් 09 වැනිදා ගෝල්ෆේස්හිදී පොලිසිය සාමකාමී උද්ඝෝෂකයින්ට බාධා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම ස්වයං මෙහෙයවීමෙන් පරීක්ෂණයක් ආරම්භ කිරීම.

8. රාජ්‍ය සේවකයන්ගේ අදහස් පළ කිරීමේ නිදහස සීමා කරමින් නිකුත් කර ඇති චක්‍රලේඛ අවලංගු කරන ලෙස වෘත්තීය සමිති එකමුතුවක් රජයෙන් ඉල්ලා සිටීම.

9. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින වසන්ත මුදලිගේ සහ ගල්වැව සිරිධම්ම හිමියන්ට අදාළ රැඳවුම් නියෝග තවදුරටත් දීර්ඝ නොකරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිවේදනය කිරීම.

10. පුනරුත්ථාපන කාර්යංශය පනත් කෙටුම්පත තුළ අන්තර්ගත 'සටන්කාමීන්', 'ප්‍රචණ්ඩකාරීන්' යන වචන ඉන් ඉවත් කළ යුතු බව ශ්‍රේෂ්ඨාධිකරණය පාර්ලිමේන්තුව වෙත දැනුම් දීම.

11. සාමකාමී විරෝධතාවකට අනිසි ලෙස බාධා කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් වූ පැමිණිල්ලකට අදාළව අධිකරණය ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් දෙදෙනකුට නොතීසි නිකුත් කිරීම.

12. සාමාකාමී උද්ඝෝෂකයන්ට පහරදීම සඳහා පොලිස් සේවයේ නිලධාරීන් සහ සම්පත් යොදා ගැනීම සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව පරීක්ෂණයක් ආරම්භ කිරීම.

13. මාධ්‍යවේදී මයිල්වාගනම් නිමලරාජන් ඝාතනය කොට වසර 22ක් ගතවීම නිමිත්තෙන් අනුස්මරණ වැඩසටහන් තුනක් පැවැත්වීම.

14. කැලණිය විශ්වවිද්‍යාලය ඉදිරිපිට පැවැති සිසු උද්ඝෝෂණයක් විසුරුවාහැරීමට කටයුතු කළ පොලිසිය, ශිෂ්‍ය ක්‍රියාකාරිකයින් 8 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.

15. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගත් අයගේ තොරතුරු මුදා හරින්නැයි තොරතුරු කොමිසම පොලිසියට නියෝග කිරීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2022 ඔක්තෝබර්**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 02 |
| නීතිමය කොන්දේසි | 11 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 02 |
| **එකතුව** | **15** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා 02ක් ඔක්තෝබර් මාසයේදී නිරීක්ෂණය විය.**

**2 වගුව: 2022 ඔක්තෝබර්: ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 02**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| මානසික බලපෑම් | 02 |
| **එකතුව** | **02** |

01. **කැලණිය සහ රජරට විශ්වවිද්‍යාලවල සිසුන් පිරිසක් ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාසයට කැඳවීම.**

බී.පී.එච්. සඳරුවන්, ටී.ජී.එම්. චන්ද්‍රසිරි, කේ.එච්.එම් තරුෂ ලක්ෂාන්, එම්. දිල්ශාන් හර්ෂණ, එන්.එම්. සංජය බණ්ඩාර සහ ගලෙන්බිඳුනුවැව ධම්මරතන හිමි ඇතුළු කැලණිය සහ රජරට විශ්ව විද්‍යාලවල සිසුන් පිරිසක් ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාසය විසින් කැඳවා ඇතැයි ඔක්. 02 වැනිදා JDS සංවිධානය වාර්තා කළේය.

මූලාශ්‍රය: https://twitter.com/JDSLanka

02. **අරගලයේ ක්‍රියාකාරිකයකු වූ ෆයිසාන් අහමඩ් අත්අඩංගුවට ගෙන මුදා හැරීම.**

අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ හිටපු ක්‍රියාකාරිකයකුද වූ ඔහු, ඔක්තෝබර් 08 වැනිදා දෙහිවල භාතිය මාවතේ පිහිටි ඔහුගේ නිවසේදී පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇති අතර පැය 4ක කාලයක් ප්‍රශ්න කිරීමෙන් පසු නිදහස් කර තිබේ.

මූලාශ්‍රය: https://twitter.com/JDSLanka

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 08ක් ඔක්තෝබර් මාසය තුළ නිරීක්ෂණය විය. අදහස් පළ කිරීමේ නිදහසට එරෙහිව ආරක්ෂක අංශවල ක්‍රියාකාරිත්වය මෙන්ම, එම නිදහස ආරක්ෂා වන ආකාරයේ සාධනීය මැදිහත්වීම් ඇතැම් අධිකරණ තීන්දු හා මානව හිමිකම් කොමිසමේ නිගමන ඔස්සේ සිදු විය. පොදුවේ අදහස් පළ කිරීමේ නිදහස මෙන්ම විශේෂයෙන් ජනමාධ්‍ය නිදහසද සීමා කිරීමේ ආණ්ඩුවේ අභිලාෂයට බරපතළ අභියෝග යක් ලෙස එම අවස්ථා සැලකිය හැකිය.**

**3 වගුව: 2022 ඔක්තෝබර්: නීතිමය කොන්දේසි - සිදුවීම් 11**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 09 |
| නව නීති පැනවීම් | 02 |
| **එකතුව** | **11** |

01. **කොළඹ නගරයේ ප්‍රදේශ කිහිපයක් අධි ආරක්ෂිත කලාප ලෙස නම් කරමින් රජය නිකුත් කර තිබූ ගැසට් නිවේදනය අවලංගු කිරීම.**

රාජ්‍ය රහස් පනතේ දෙවන වගන්තිය යටතේ සැප්තැම්බර් 23 වැනිදා, ජනාධිපතිවරයා විසින් අංක 2298/53 දරන මෙම අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලද අතර ඔක්තෝබර් 01 වැනිදා එය ජනාධිපතිවරයා විසින්ම අවලංගු කෙරිණි.

අදාළ ගැසට් නිවේදනය මගින් නම් කර ඇති ප්‍රදේශවල, පොලිස්පතිවරයාගේ හෝ බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව පෙළපාලි හෝ සිද්ධ රැස්වීම් පැවැත්වීම තහනම් කොට තිබුණු අතර ශ්‍රී ලංකා නීතිඥ සංගමය ඇතුළු සංවිධාන ගණනාවක් ඊට විරෝධය පළ කළේය. මෙය පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බවත්, රජය අදාළ නිවේදනය ඉවත් කර ගත යුතු බවත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කළේය.

මූලාශ්‍රය: https://www.newsfirst.lk

02. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තබාගෙන සිටි ශිෂ්‍ය ක්‍රියාකාරික හෂාන් ජීවන්ත අධිකරණයෙන් නිදහස් කිරීම.**

දින 50ක කාලයක් තංගල්ලේ සහ කොළඹ රැඳවුම් මධ්‍යස්ථානවල රඳවා තබාගෙන සිටි ඔහු ඔක්තෝබර් 7 වැනිදා ත්‍රස්තවාදය වැළැක්වීමේ කොට්ඨාසය විසින් තංගල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කෙරිණි. චෝදනා කිසිවක් නොමැතිවීම නිසා ඔහු නිදහස් කිරීමට මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය. අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ සමඟ ඔහු අත්අඩංගුවට ගෙන තිබුණේ අගෝස්තු 18 වැනිදා කොළඹදීය.

මූලාශ්‍රය: https://medialk.com

03. **ගෝල්ෆේස්හි පැවති 'අරගලයේ විරු සමරුව' වැඩසටහනට පොලිසිය බාධා කිරීම හා සහභාගී වූවන් 6 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.**

ඔක්තෝබර් 9 වැනිදා පැවති මෙම වැඩසටහන නීති විරෝධී රැස්වීමක් ලෙස අර්ථ දක්වමින් එය විසුරුවාහැරීමට පොලිසිය නියෝග කළ අතර විරෝධතාකරුවන් 6

දෙනෙකු කොටුව පොලිසිය මගින් අත්අඩංගුවට ගැනිණි. ඒ අතරින් 16 හැවිරිදි පාසල් සිසුවකු වූ උවිඳු රාජපක්ෂ පොලිස් ඇප මත මුදාහරින ලදි.

රොෂාන් ප්‍රනාන්දු, ධනුෂ්ක ලක්මාල් ජයමාන්න, ලියනගේ විමලසිරි, මොහොමඩ් අයිරාෆ් මොහොමඩ් සහ දේශාන් ඉම්රෝන් යන සැකකරුවන් ඔක්. 10 වැනිදා කොටුව මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඇප මත මුදාහැරිණි.

මූලාශ්‍රය: http://www.colombopage.com

04. **නීතිඥවරුන් සහ වෘත්තිකයින් විසින් පැවැත්වීමට නියමිත උද්ඝෝෂණයක් වළක්වන ලෙස පොලිසිය කළ ඉල්ලීමක් අධිකරණය ප්‍රතික්ෂේප කිරීම.**

ඔක්තෝබර් 9 වැනිදා පැවති 'අරගලයේ විරු සමරුව'ට පොලිසිය බාධා කිරීමට එරෙහිව ඔක්. 10 වැනිදා ගෝල්ෆේස්හිදී මෙම විරෝධය පැවැත්වීමට නියමිත වූ අතර, එය අත්හිටුවන ලෙස පොලිසිය කළ ඉල්ලීම කොටුව මහේස්ත්‍රාත්වරයා ප්‍රතික්ෂේප කළේය.

මූලාශ්‍රය: https://www.bbc.com

05. **ඔක්තෝබර් 09 වැනිදා ගෝල්ෆේස්හිදී පොලිසිය සාමකාමී උද්ඝෝෂකයින්ට බාධා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම ස්වයං මෙහෙයවීමෙන් පරීක්ෂණයක් ආරම්භ කිරීම.**

ශ්‍රී ලංකා තරුණ මාධ්‍යවේදීන්ගේ සංගමයද මේ පිළිබඳව පරීක්ෂණයක් ඉල්ලා සිටි අතර, අදාළ රැස්වීම විසුරුවාහැරීමට නියෝග කළේ කවර නීතිමය ප්‍රතිපාදන මත දැයි පැහැදිලි කරන ලෙස කොමිසම පසුවදාම පොලිස්පතිවරයාට දැනුම් දී තිබිණි. මේ පිළිබඳ විමර්ශනය ඔක්තෝබර් 18 වැනිදා ආරම්භ වූ අතර තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය අදාළ සිදුවීම පිළිබඳ ලේඛන සහ වීඩියෝ සාක්ෂි 21ක් ඉදිරිපත් කළේය. එමෙන්ම බාධා සිදු කළ පොලිස් නිලධාරීන් 8 දෙනෙකු පිළිබඳ සාක්ෂි සහ තොරතුරුද තවත් නිලධාරීන් 11 දෙනෙකුගේ ඡායාරූපද ඉදිරිපත් කෙරිණි.

මූලාශ්‍රය: https://medialk.com

06. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින වසන්ත මුදලිගේ සහ ගල්වැව සිරිධම්ම හිමියන්ට අදාළ රැඳවුම් නියෝග තවදුරටත් දීර්ඝ නොකරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිවේදනය කිරීම.**

මෙම සැකකරුවන් සම්බන්ධ පරීක්ෂණ පිළිබඳව ප්‍රගති වාර්තාවක්, ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් කොමිෂන් සභාව වෙත තවමත් ලබා දී නොමැති බවත්, ඔවුන් දිගින් දිගටම සිරගත කිරීම හා හිරිහැරයට ලක් කිරීම මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බවත් එම නිවේදනයෙන් අවධාරණය කර තිබේ.

මේ අතර, තංගල්ල බන්ධනාගාරයේ රඳවා සිටි සිටි සැකකරුවන් අධිකරණයට නොදන්වා කොළඹ ත්‍රස්ත විමර්ශන ඒකකයට රැගෙන යෑම සහ එහිදී ඔවුන් රෝගාතුර වීම සම්බන්ධයෙන් නීතිඥ නුවන් බෝපගේ ඔක්. 26 වැනිදා තංගල්ල මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කළේය. එහිදී මහේස්ත්‍රාත්වරයා, ත්‍රස්ත විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂවරයාට ඔක්. 28 වැනිදා අධිකරණය හමුවේ පෙනී සිට මේ පිළිබඳව කරුණු දක්වන ලෙස නියෝග කළේය. 28 වැනිදා නඩුව කැඳවූ අවස්ථාවේ මහේස්ත්‍රාත්වරයා නියෝග කළේ, විමර්ශනවල ප්‍රගතිය නොවැම්බර් 04 වැනිදා අධිකරණයට ඉදිරිපත් කරන ලෙසයි.

මූලාශ්‍රය: https://www.facebook.com/Liveat8.lk

07. **පුනරුත්ථාපන කාර්යංශය පනත් කෙටුම්පත තුළ අන්තර්ගත 'සටන්කාමීන්', 'ප්‍රචණ්ඩකාරීන්' යන වචන ඉන් ඉවත් කළ යුතු බව ශ්‍රේෂ්ඨාධිකරණය පාර්ලිමේන්තුව වෙත දැනුම් දීම.**

පුනරුත්ථාපන කාර්යාංශය පනත් කෙටුම්පත අධිකරණ ඇමතිවරයා විසින් 2022 සැප්තැම්බර් 23 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණු අතර පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. එම්. මරික්කාර් සහ තවත් පාර්ශ්ව මෙම කෙටුම්පත අභියෝගයට ලක්කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉදිරිපත් කළේය. අරගලයේ ක්‍රියාකාරිකයන්ට එරෙහිව ආණ්ඩුව මෙම පනත යොදාගැනීමට සූදානම් වන බවට බරපතළ සැක මතු විය. ශ්‍රේෂ්ඨාධිකරණය නිගමනය කර ඇත්තේ, අදාළ පනත මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා පමණක් සීමා විය යුතු බවයි.

මූලාශ්‍රය: https://www.bbc.com

08. **සාමකාමී විරෝධතාවකට අනිසි ලෙස බාධා කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් වූ පැමිණිල්ලකට අදාළව අධිකරණය ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් දෙදෙනෙකුට නොතීසි නිකුත් කිරීම.**

ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය වෙනුවෙන් මාධ්‍යවේදී තරිඳු ජයවර්ධන විසින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ ගොනු කර ඇති පෞද්ගලික නඩුවකට අදාළව සහකාර පොලිස් අධිකාරී නලින් දිල්රුක් සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රොෂාන් ඩයස් යන අයට මෙසේ නොතීසි නිකුත් කෙරිණි.

ඔක්තෝබර් 9 වැනිදා නීතිඥයින්, මාධ්‍යවේදීන් සහ වෘත්තිකයන් සහභාගී වූ විරෝධතාවක් වැළැක්වීමට නීති විරෝධී ලෙස කටයුතු කරන ලදැයි එම පොලිස්

නිලධාරීන්ට එරෙහිව චෝදනා ගොනු කර ඇත. ජනාධිපති නීතිඥ සාලිය පීරිස්, නීතිඥ මනුජය සිල්වා සහ නීතිඥ ජයන්ත දෙහිඅත්තගේ පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටිති.

මූලාශ්‍රය: https://satahan.blog

09. **සාමාකාමී උද්ඝෝෂකයන්ට පහරදීම සඳහා පොලිස් සේවයේ නිලධාරීන් සහ සම්පත් යොදා ගැනීම සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව පරීක්ෂණයක් ආරම්භ කිරීම.**

තරුණ නීතිඥ සංගමය සහ තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය එක්ව ආරම්භ කරන ලද මර්දනයට එරෙහි ක්‍රියාකාරී කමිටුව විසින් සැප්තැම්බර් 22 වැනිදා සිදු කළ පැමිණිල්ලක් අනුව බීසී/1760/2022 අංකය යටතේ මෙම විමර්ශනය ආරම්භ කර තිබේ.

මූලාශ්‍රය: https://satahan.blog

10. **කැලණිය විශ්වවිද්‍යාලය ඉදිරිපිට පැවැති සිසු උද්ඝෝෂණයක් විසුරුවාහැරීමට කටයුතු කළ පොලිසිය, ශිෂ්‍ය ක්‍රියාකාරිකයින් 8 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින සිසු නායකයින් නිදහස් කරන ලෙස බල කරමින් අන්තර් විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය බලමණ්ඩලය විසින් ඔක්. 18 වැනිදා මෙම විරෝධය සංවිධානය කර තිබුණු අතර, ඒ සඳහා පොලිසියෙන් අවසර ගෙන නොමැති බව සඳහන් කරමින් පොලිසිය එය විසුරුවාහැරීමට නියෝග කළේය. එහිදී අත්අඩංගුවට ගත් කැළුම් මුදන්නායක, ඩිල්ෂාන් හර්ෂණ, ශශික දිල්හාර, විහංග ළහිරු, අසේල මධුවන්ත, ගිහාන් කුමාර, ෆ්‍රැන්සිස් ජීවන් සහ කොහොඹගානේ සිරිරතන හිමි 19 වැනිදා මහර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඇප මත මුදාහැරිණි.

මූලාශ්‍ර: 1. https://www.newsfirst.lk
2. https://www.newsfirst.lk

11. **ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගත් අයගේ තොරතුරු මුදා හරින්නැයි තොරතුරු කොමිසම පොලිසියට නියෝග කිරීම.**

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව එලෙස නියෝග කළේ නීතිඥ සුරේන් ඩී. පෙරේරා ගොනු කළ අභියාචනයක් විභාග කිරීමෙන් පසු තීන්දුව ලබා දෙමිනි. 2019 සිට 2021 නොවැම්බර් දක්වා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තබාගෙන සිටි සංඛ්‍යාව සහ ඔවුන්ගේ තොරතුරු පොලිස් මූලස්ථානයෙන් ඉල්ලා සිටි විට එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් මෙම අභියාචනය ඉදිරිපත් කර තිබිණි.

අදාළ තොරතුරු ඔක්තෝබර් 28 වැනිදාට පෙර මුදා හරින ලෙස පොලිසියට නියෝග කළ කොමිෂන් සභාව, මෙම තොරතුරු නිශ්චිත කාලය ඇතුළත ලබා නොදෙන්නේ නම් ශ්‍රී ලංකා පොලිසියට සහ තොරතුරු නිලධාරීට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට තීරණය කළ බවද දැනුම් දුන්නේය.

මූලාශ්‍රය: https://rticsr.info/ptarti/

## ව්‍යුහාත්මක කොන්දේසි

**මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන දර්ශක 6ක් මෙම මානයට ඇතුළත්ය. ඒ අතරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' යන දර්ශකයට අයත් වන සිදුවීම් දෙකක් මෙහි ඇතුළත් වේ. නීතිමය කොන්දේසි යන සංරචකය යටතේ ඉදිරිපත් කර ඇති විශේෂ සිදුවීම් සම්බන්ධයෙන් මානව හිමිකම් ආරක්ෂකයින් කළ මැදිහත්වීම් රැසක් මෙම දර්ශකයට අදාළ වුවද ප්‍රායෝගික තත්ත්වය අනුව ඒ සියල්ල මෙහි වෙනම සඳහන් කර නොමැත.**

**4 වගුව: 2022 ඔක්තෝබර්: ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 02**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 02 |
| **එකතුව** | **02** |

**01. රාජ්‍ය සේවකයන්ගේ අදහස් පළ කිරීමේ නිදහස සීමා කරමින් නිකුත් කර ඇති චක්‍රලේඛ අවලංගු කරන ලෙස වෘත්තීය සමිති එකමුතුවක් රජයෙන් ඉල්ලා සිටීම.**

රාජ්‍ය සේවකයන්ට සමාජ මාධ්‍ය ඇතුළුව ජනමාධ්‍ය ඔස්සේ අදහස් පළ කිරීමේ නිදහස සීමා කරමින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය 2022 සැප්තැම්බර් 27 වැනිදා සහ හා සෞඛ්‍ය අමාත්‍යාංශය ඊට පෙර මෙම චක්‍රලේඛ නිකුත් කර තිබිණි.

සමස්ත ලංකා සංවර්ධන නිලධාරීන්ගේ සංගමය, රජයේ පවුල් සෞඛ්‍ය සේවා සංගමය, ඒකාබද්ධ සංවර්ධන නිලධාරී මධ්‍යස්ථානය, රාජ්‍ය හා පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරීන්ගේ වෘත්තීය සමිති සම්මේලනය සහ ඒකාබද්ධ සෞඛ්‍ය සේවා සංගමය යන සංවිධාන මෙම චක්‍රලේඛ අවලංගු කරන ලෙස ඉල්ලා සිටී.

මූලාශ්‍රය: https://www.youtube.com

**02. මාධ්‍යවේදී මයිල්වාගනම් නිමලරාජන් ඝාතනය කොට වසර 22ක් ගතවීම නිමිත්තෙන් අනුස්මරණ වැඩසටහන් තුනක් පැවැත්වීම.**

අධිආරක්ෂක කලාපයක් තුළ පිහිටි සිය නිවසේ සිටියදී 2000 ඔක්තෝබර් 19 වැනිදා නිමලරාජන් වෙඩි තබා ඝාතනය කෙරුණු අතර, ඒ සම්බන්ධයෙන් චූදිතයන්ව සිටි හමුදාව සමග සහයෝගයෙන් ක්‍රියා කළ සන්නද්ධ කණ්ඩායමක සාමාජිකයන් නීතිපතිවරයාගේ මැදිහත්වීමෙන් පසුව මුදාහැරිණි.

නොවැම්බර් 19 වැනිදා යාපනය මාධ්‍ය සමාජය විසින් යාපනයේදීද, මුලතිව් මාධ්‍ය සමාජය විසින් මුලතිව්හිදීද, මඩකලපුව මඩකලපු දිස්ත්‍රික් දෙමළ මාධ්‍යවේදීන්ගේ සංගමය සහ මඩකලපු මාධ්‍ය සමාජයේ සාමාජිකයන් විසින් ගාන්ධි උද්‍යානයේදීද මෙම අනුස්මරණයන් පවත්වන ලදි.

මූලාශ්‍රය: https://tamilwin.com

**6 වගුව: මාධ්‍ය නිදහස: 2022 ජනවාරි - ඔක්තෝබර් දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| ආවරණය කර ඇති සංරචකය | 2022 ජනවාරි-සැප්තැම්බර් | | 2022 ඔක්තෝබර් |
|---|---|---|---|
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 55 | | 02 |
| නීතිමය කොන්දේසි | 88 | 21 | 11 |
| මාධ්‍යයේ ස්වාධීත්වය | 06 | | - |
| වෘත්තීයවේදීත්වය | 06 | | - |
| ව්‍යුහාත්මක කොන්දේසි | 14 | 01 | 02 |
| **එකතුව** | **169** | **22** | **15** |

2022 මාධ්‍ය නිදහස මාසික වාර්තාව ජනවාරි-සැප්තැම්බර් මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවි සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


Free Media Movement

Convener: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995
Treasurer: Ananda Jayasekara +94 77 312 4850
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25